මාධ්‍ය නිවේදනය
සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| නිකුත් කළේ | මූල්‍ය බුද්ධි ඒකකය |
|---|---|
| දිනය | 2023 ජූලි 27 |

## ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති/ජාතික සම්බන්ධීකරණ කමිටුවේ සභාපති ආචාර්ය නන්දලාල් වීරසිංහ මහතා , 2023 ජූලි 11 සිට 14 දක්වා කැනඩාවේ වැන්කුවර් නගරයේ පැවති මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායමේ වාර්ෂික සැසිය සඳහා සහභාගී වෙයි.

2023 ජූලි 11 සිට 14 දක්වා කැනඩාවේ වැන්කුවර් හි පැවති, මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායමේ 2023 වාර්ෂික සැසිය සහ තාක්ෂණික සහාය සහ පුහුණු (TA&T) සැසිය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති ආචාර්ය නන්දලාල් වීරසිංහ මහතා ,මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීම පිළිබඳ ජාතික සම්බන්ධීකරණ කමිටුවේ සභාපති වශයෙන් ශ්‍රී ලංකා නියෝජිත පිරිස සමග සහභාගී විය. ලාඕසය, නේපාලය සහ බෲනායි යන රටවල් තුනෙහි අන්‍යෝන්‍ය ඇගයීම් සඳහා සහභාගී වූ ශ්‍රී ලාංකික නිලධාරීන්ගෙන් එම නියෝජිත පිරිස, සමන්විත විය. එම වාර්ෂික සැසිය සඳහා ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායමේ සාමාජික රටවල් 42 ක නියෝජිතයින් 300 කට අධික සංඛ්‍යාවක් මෙන්ම අනෙකුත් නිරීක්ෂකයින් සහ පුද්ගලික අංශයේ පාර්ශවකරුවන් එක් වූ අතර, එහිදී මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදයට මුදල් සැපයීම ඇතුළු බරපතල මූල්‍ය අපරාධ හා සමූලඝාතක අවි මූල්‍යනය සම්බන්ධ තීරණාත්මක ගැටළු සාකච්ඡා කරන ලදී .

2023 ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායමෙහි සම මුලසුන දරන ලද්දේ කැනඩාවේ මුදල් දෙපාර්තමේන්තුවේ සහකාර නියෝජ්‍ය මුදල් අමාත්‍ය ජූලියන් බ්‍රාසීහු (Julien Brazeau) සහ ඕස්ට්‍රේලියානු ෆෙඩරල් පොලිසියේ නියෝජ්‍ය කොමසාරිස් ඉයන් මැකාර්ට්නි (Ian McCartney) විසිනි.

මෙම සභාව අතරතුර, ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය (FIU) සහ ටිමෝරයේ සහ ලාඕසයේ මූල්‍ය බුද්ධි ඒකක අතර අවබෝධතා ගිවිසුම් දෙකක් (MOU) අත්සන් කරන

ලදී. මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමට එරෙහිව සටන් කිරීමේදී ජාත්‍යන්තර සහයෝගීතාව සහ සම්බන්ධීකරණය ඉහළ නැංවීමෙහිලා මෙම ගිවිසුම් මහෝපකාරී වනු ඇත. නීතිවිරෝධී මූල්‍ය ක්‍රියාකාරකම්වලට එරෙහි ක්‍රියාදාමයේදී ජාත්‍යන්තර සබඳතා ශක්තිමත් කිරීමට ශ්‍රී ලංකාවේ කැපවීම පිළිබිඹු කරමින් ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති ආචාර්ය නන්දලාල් වීරසිංහ මහතා  මෙම අවබෝධතා ගිවිසුම් සම්බන්ධීකරණය සඳහා පහසුකම් සැලසීමේදී නායකත්වය ලබා දුන්නේය.



ශ්‍රී ලංකාවේ මූල්‍ය බුද්ධි ඒකකය  සහ ටිමෝරය-ලෙස්ටේ මූල්‍ය බුද්ධි ඒකකය අතර අවබෝධතා ගිවිසුමට අත්සන් තැබීමට ආචාර්ය නන්දලාල් වීරසිංහ මහතා  සහ ටිමෝරය-ලෙස්ටේ මූල්‍ය බුද්ධි ඒකකයේ ප්‍රධානී මාරියා ජොසේ ඩි ජීසස් සර්මෙන්ටෝ මහත්මිය සහභාගී විය.



ශ්‍රී ලංකා සහ ටිමෝරය-ලෙස්ටේ නියෝජිතයන් සමඟ




ශ්‍රී ලංකාවේ මූල්‍ය බුද්ධි ඒකකය සහ ලාඕසයේ මූල්‍ය බුද්ධි ඒකකය අතර අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම අධිපති වීරසිංහ මහතා විසින් ලාඕස බැංකුවේ නියෝජ්‍ය අධිපති වතනා දලලෝයි මහත්මිය සමඟ හුවමාරු කර ගන්නා ලදී.

මීට අමතරව අධිපතිතුමා විවිධ රටවල සහ ජාත්‍යන්තර සංවිධානවල දූත පිරිස් ද හමුවිය.

- බෲනායි මුදල් හා ආර්ථික අමාත්‍යාංශයයේ මුදල් හා ආර්ථික නියෝජ්‍ය අමාත්‍ය (මූල්‍ය), ශෙටි සුහියානා පෙන්ගිරන් ඩාටෝ පදුක හජි සනී මහත්මියගේ නායකත්වයෙන් යුත් බෲනායි නියෝජිත කණ්ඩායම
- ඉන්දියාවේ මූල්‍ය බුද්ධි ඒකකයෙහි අධ්‍යක්ෂ විවේක් අග්‍රාවල් මහතා ප්‍රමුඛ ඉන්දීය නියෝජිත කණ්ඩායම

  මැලේසියානු මහ බැංකුවෙහි නියෝජ්‍ය අධිපති මර්ෂුනිසාම් ඕමාර් මහතා ප්‍රමුඛ මැලේසියානු නියෝජිත කණ්ඩායම
- නේපාල මහ බැංකුවේ අධිපති මහා ප්‍රසාද් අධිකාරි මහතා ප්‍රමුඛ නේපාල නියෝජිත කණ්ඩායම
- පකිස්ථානයේ මූල්‍ය අධීක්ෂණ ඒකකයේ අධ්‍යක්ෂ ජනරාල් ලුබ්නා මලික් මහත්මියගේ නායකත්වයෙන් යුත් පකිස්ථාන නියෝජිත කණ්ඩායම

- පැපුවා නිව්ගිනියා බැංකුවේ වැඩබලන අධිපති එලිසබෙත් ජිනියා මහත්මියගේ නායකත්වයෙන් යුත් පැපුවා නිව්ගිනියා නියෝජිත කණ්ඩායම

මීට අමතරව, 2025 මාර්තු මාසයේදී පැවැත්වීමට නියමිත අන්‍යෝන්‍ය ඇගයීමේදී ශ්‍රී ලංකාවට අවශ්‍ය තාක්‍ෂණික සහය ලබා ගැනීම සඳහා අධිපතිවරයා විසින් බහුපාර්ශ්වික තාක්ෂණික සහය සපයන්නන් සහ ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් සමඟ සාකච්ඡා පවත්වන ලදී.

මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීම සඳහා රටක් වශයෙන් දක්වන උනන්දුව සහ ස්ථිරසාර කැපවීම පිළිඹිබු කිරීමටත්, එය තව දුරටත් ශක්තිමත් කර ගැනීමටත් ශ්‍රී ලංකික නියෝජිත පිරිසට හැකියාව ලැබුණු අතර, රටේ මූල්‍ය පද්ධතියේ ශක්තිමත්බව සහ ස්ථායීතාවය සහතික කිරීමට මෙන්ම අසල්වැසි රටවල් සමග අන්තර් සම්බන්ධතා ගොඩනගා ගැනීමටද මෙම ආසියා ශාන්තිකර කලාපීය කලාපීය වාර්ෂික සැසිය මහෝපකාරී විය.